# පාරුව වැනි ගෙයක් මේ මුළු ලොවේ නැත

මහානාම දුනුමාල



පැරණි උඩරට රාජධානිය පරිපාලන ඒකක වශයෙන් දිසා දොළොසකට හා රටවල් නවයකට බෙදා තිබිණි. දිසා විශාල පරිපාලන ඒකකය වූ අතර රටවල් ඊට වඩා කුඩා පරිපාලන ඒකක විය. දිසාව දිසාවේ විසින් ද, රටවල් රටේ මහත්වරුන් විසින් ද පාලනය කරන ලදී. මේ දිසා අතර සයවන දිසාව තුන් කෝරලයයි. තුන් කෝරලයේ දිසාවේ බේරුණ්ඩ පක්ෂියා කොඩිය රැගෙන පෙරහැරේ ගමන් කළේ ද සයවෙනුව ය. පසු කලෙක පාත බුලත්ගම නම් රට තුන් කෝරලයට එක් කෙරිණි. බ්‍රිතාන්‍යය යුගයේදී තුන් කෝරලයත්, සතර කෝරලයත් එක් කොට කෑගලු දිස්ත්‍රිරික්කය නිර්මාණය කෙරිණි. තුන් කෝරලයේ මතකය පැරණි තුන් කෝරල වාසීන්ගේ කෙළිසෙල්ලම්, සිරිත්විරිත්, ජනශ්‍රැළුති, රැකීරක්ෂා, කර්මාන්ත, ගමන්බිමන් ඈ නොයෙක් දේ පිළිබඳ මතකය සොයා යන ලිපි ගමනේ ආරම්භයක් ය.

තුන් කෝරලය හරහා ගලා බසින කැලණි ගඟ හා සීතාවක ගඟ, ගුරුගොඩ ඔය, රිටිගහ ඔය, වී ඔය ආදී එහි අතු ඉති සමුදාය තුන් කෝරලය ජලාශ්‍රි ත පෙදෙසක් බවට පත් කරයි. අතීතයේ පටන් ම ගමන් බිමන් වලදී තොටුපලකින් එතෙර වන්නට ඔරුව හා අගු ල භාවිතයට ගැනිණි. දැව ගඟ දිගේ ප්‍ර වාහනය කරන ලද්දේ පහුරු මඟිනි. විසිවන සියවසේ මුල් භාගයේදී ගමේ නිෂ්පාදන කොළඹටත්, කොළඹින් ගමේ කඩපොළට බඩුමුට්ටු ගෙනෙන්නටත් ප්‍රධාන පරිවහන මාධ්‍ය සේ යොදා ගත්තේ පාරුව් යි.

"ඉස්සර අපි පුංචි උන් සන්දියෙ කැලණි ගඟ හරියට මහපාරක් වගේ. දැන් පාරේ බස් යන්නැහේ ගඟේ පහුරු, පාරු, ඔරු, අගුල් වගේ යාත්තරා ගමන් කොළා."

අදින් අවුරුදු විස්සකට පමණ පෙර කැලණි නදිය අසබඩ පදිංචිව සිටි ඒ වන විට ජීවිතයේ අගිස්සට ගොස් සිටි ගැමියෙක් (අද ජීවතුන් අතර නැති) මා හා කීවේ සිය පැටි විය සිහිගන්වමිනි. කොහෙ-ාමටත් ගංගාශ්‍රි ත පෙදෙස්වල එදා ප්‍රධාන ප්‍ර)වාහන මාධ්‍යස වූ පාරුව ලොරි රථ වැඩි වන විට සිය කාර්ය භාරය ලොරියට පවරා දෙමින් ඉතිහාසයට එක් වූයේ ය.

පාරුව හැඩයෙන් අඟුලට සමානකම් දක්වන යාත්‍රායවකි. එහෙත් එය අගු ලට වඩා බෙහෙවින් විශාල ය. එබැවින් පාරුව තනන විට විශාල ඔරු දෙකක් තනා ගත යුතු ය. ඔරුවක් හදන්නට කඩතීරු දෙකක් අවශ්‍යන ය. ඔරු දෙකක් සඳහා අවශ්‍ය කඩතීරු ගණන හතරකි. මේ කඩතීරු ඉරා ගන්නේ කොස් වැනි සවිමත් දැවයකිනි. අනතුරුව කඩතීරු අතරින් ලෑලි ගසා ඔරු සාදා ගනී. මෙම ලෑලි සඳහා කොස්, හොර වැනි ඔරොත්තු දෙන දැව යොදා ගනී. මෙසේ තනා ගන්නා ඔරු දෙක එක් කර සවිමත් තට්ටුවක් තනා ගත යුතු ය. ඔරු දෙක එක් කොට තට්ටුව සකසන්නේ බෝම්බු වැනි සවිමත් ලී වලින් බාල්ක දමා ඒ මත ලෑලි ගැසීමෙනි. පාරුවට අඹරාවක් බැඳිය යුතු ය. (කරත්ත තට්ටුව මත ද පියස්සක් වශයෙන් බඳින්නේ අඹරාවකි.) පාරුව මත ද ආරුක්කුමය හැඩයකට බඳින පියස්ස අඹරාවයි. පාරු තට්ටුව වැසෙන සේ අඹරාව බැඳ පොල් අතු සෙවිලි කිරීම සිදුවිය. කරත්තයෙන් මෙන් ම පාරුවෙන් ද බඩුමුට්ටු ප්‍රසවාහනය කෙරෙන බැවින් ඒවා නො තෙමී ආරක්ෂා කරගන්නට අඹරාව අවශ්‍ය විය. පාරුක්කාරයන්ගේ රෙදි, පහේ ජාති, බුලත්පහේ, මුල් දිනයේ ගෙදරින් ගෙන යන බත්ගෙඩි (බත්මුල), පිහිය, උයනපිහින කලප්පන්න ආදිය තැන්පත් කරන්නේ ද අඹරාව ඇතුළේ ය.

පාරුවට කුඩා ඔරුවක් ද සම්බන්ධ කෙරෙයි. මෙම කුඩා ඔරුව හැඳින්වූයේ නතර ඔරුව නමිනි. නතර ඔරුව දෙදෙනකුට ගමන් කළ හැකි කුඩා ඔරුවකි. ග ගේ අසීරු තැන්වල ගමන් කරන විට නතර ඔරුවේ සිටින ඔරු කාරයෝ ඔරුව දුරට ගෙන ගොස් ගඟට නැමුණු අත්තක කිත්තං කඹය ගැට ගසති. කිත්තං කඹයේ අනෙක් කොන පාරුවට සම්බන්ධ ය. පාරුවේ සිටින්නන් කිත්තං කඹය අදින විට පාරුව ගමන් කරයි. පාරුවේ දෙපැත්තෙන් සිටින රිටි කාරයෝ පාරුව හැරෙන්නට නො දී රිටෙන් පාරුව නිසි මගට ගනිති. රිටි කාරයන් කර මේ කාර්යය පාරු භාෂාවේ හැඳින්වෙන්නේ අවර අල්ලනවා යන වදනිනි.

පාරුව තුන් කෝරලයේ රුවන්වැල්ල, යටියන්තොට වැනි ස්ථානවල සිට පිටත්වන්නේ ගමෙන් කොළඹට ගෙන යන පුවක්, පෙතිපුවක්, කෝපි, ගම්මිරිස්, කොප්පරා ආදී වෙළඳ ද්‍රිව්‍යව පටවාගෙන ය. බෝගල මිනිරන් පතලේ මිනිරන් කොළඹට ප්‍රිවාහනය කරන්නට ද පාරු යොදවාගෙන තිබේ. කොළඹ ගිය පාරුව යළි ආපසු එන්නේ රුවන්වැල්ල ඇතුළු තුන් කෝරලයේ කඩමණ්ඩිවල මුදලාලිලාට ඇවැසි හාල්, කරවල, පරිප්පු, අර්තාපල්, පිටි ආදී ද්‍රරව්‍යය පුරවාගෙන ය. කො හොමටත් පාරුව වර්තමානයේ දක්නට ලැබෙන කන්ටේනරයක තරම් බඩු ප්‍රලමාණයක් පටවා ගෙන එන ප්‍රවවාහන යාත්‍රාවවක් බව පැරණි අයගේ මතයයි.

පාරුව වටින් ගොඩින් එළිය වැටෙන විට රංවල දෙවියන්ට පඬුරු බැඳ දියත් කෙරේ. බොහෝ විට පාරුකාරයෝ පළමු දින හීලත්, දාවල් වේලත් බත්ගෙඩි සේ ගෙනියති. අවශ්‍යු නම් රෑ වේල ගෙනයන්නට ද හැකි ය. බත්ගෙඩිය කොළපතක ඔතන ලද්දකි. ඉතින් ලේසියෙන් පිළුණු නො වේ. වේලෙන්න උයන ලද අල, හොඳින් මැලවූ පොල්සම්බල, තෙලින් බැඳගත් හාල්මැස්සෝ, මියන කොළ වැනි දෑ ඊට අඩංගු ය. ඇතැම් රැයක පාරුකාරයෝ සාමූහිකව බත් පිසති. ගඟ දෙපස කඩමණ්ඩිවල ආහාරපාන සපයන කඩ තිබේ. ඔවුහු පාරුකාරයන් කැමති ආහාරපාන පිස දෙත්. කොහෙ-ාමටත් ඒ පිළිබඳ තීන්දු තීරණ ගන්නේ තණ්ඩේල ය.

(තණ්ඩලේ යනු පාරුවක හෝ ගැල්පෙළෙක නායකයා හඳුන්වන නමයි.) මත්පැන් අවශ්‍යු අයට ඒවා ලබාගන්නට ද ගඟ දෙපස පහසුකම් තිබේ. පාරුව ඇසුරින් බිහි වූ ජන සාහිත්‍ය.ය පාරු කවියයි. අඹරාව සහිත පාරුව ගෙයකට සමාන කෙරෙන මෙම කවිය එක් පාරු කවියකි.

සීරුව ඔබට කණු නො ම සිටුවා මහත
වාරුව ඇතුව දිය පිට තැනු ගෙයක් ඇත
මාරුව තැනින් තැන බඩු ගෙන ගමන් යත
පාරුව වැනි ගෙයක් මේ මුළු ලොවේ නැත

1825 දී තොටළඟ කරත්ත ගමනාගමනයට ඔරු 21 ක් මත ලී තට්ටුවක් සකසා ඔරු පාලම සකස් කෙරිණි. මෙම ඔරු පාලම දිනකට පැයක් ඉවත් කළ බව කියැවේ. ඒ පාරු හා පහුරුවලට ගමන් කරන්නට ය.

පාරුකාරයෝ වැඩි දවසක් ගඟ දිය බත කල් යැවූ දුෂ්කර රැකියාවක් කළ වීර්යවන්ත මිනිස්සු වෙත්. අද බඩු ගෙන පාරුව අපේ මතකයෙන් ඈත් වූ අතීතයට අයත් සුන්දර මතකයකි.



# මා බාල කාලේ...

## කවිඳු ජයසිංහ

### අරලගංවිල අලුත් ඉස්කෝලේ

එවකට මගේ වයස යන්තම් අවුරුදු 10 ක් වුවා පමණි. මම අ/කිරඹඔය විද්‍යා.ලයේ සිට අරලගංවිල කණිෂ්ට ද්විතියික විද්‍යාලයට මාරුවක් ලබා (ප්‍රාථමික පන්ති සිසුවකු ලෙස) පැමිණි කාලයයි ඒ. අලුත් පාසලට පැමිණි මුල්ම දිනයේ මා 4 නෙලුම් පන්තියට ගැනීමට පන්ති භාර ගුරුතුමිය වූ කොස්ගම ටීචර් " මේ නාමරත්න මහත්තයාගේ පුතා නේද?" කියමින් පොර කැ හැටි තවමත් මතකය.

මාගේ මතකය නිවැරදි නම් නෙලුම් යනු ගණිතය සහ භාෂාවට දක්ෂම ළමයින් සිටි පන්තියයි. එහි 4 නෙලුම්, මානෙල් , සමන් සහ රෝස යනුවෙන් කො-ටස් 4 ක් තිබුණි. දක්ෂ අදක්ෂ කතා වල වගක් නැති මම මගේ හිතට අල්ලන යාළුවන් සිටි පන්තිය 4 මානෙල් තෝරා ගත්තෙමි.

කොස්ගම ටීචර් "පුතේ තාත්තා අපේ යාලුවෙක් " කියමින් කොතරම් පෙරැත්ත කළද මම 4 මානෙල් පන්තියේ ස්ථිරවම ස්ථාන ගත වුයෙමි. එය නෙලුම් පන්තියෙන් වෙන් වුයේ කුඩා පුටු දෙපේලියක පරතරයකින් පමණි.

මෙය කොස්ගම ටීචර්ටද සතුටට කාරණායක් විය. ඒ ඇයගේ පන්තියේ නොවුනත් මගේ එදිනෙදා ප්‍රගතිය ඇයට නිතරම පෙනෙන තැනක මම අවසානයේ මගේ ස්ථානය තෝරා ගැනීමයි. අදටත් මට ඇයගේ නම සහ රූපය හොඳින් මතක් තිබෙන්නට ප්‍රධාන හේතුවක් වියහැක්කේ ඇය තුළ මගේ දියුණුව ගැන තිබූ ඒ උනන්දුව විය යුතුය.

මානෙල් පන්තියේ සිටි නන්දා ටීචර්ද එවැනිම හොඳ ගුරු මාතාවකි .. නමුත් ඇයට ඉල්ලීමකින් තොරවම ජයග්‍රහණය ලැබුණි. මානෙල් පන්තියේ මගේ සගයන් අතර සිටියේ දඟ වැඩ වලට හොඳින් හුරුවී සිටි ප්‍රියංක, සහන්, රත්නසිරි, ලලිත් මෙන්ම මට කලින් මානෙල් පන්තියේ දක්ෂයා වූ චන්දිම නාමරත්නයි.

මට මතක හැටියට හඳපානාගල ලාල් ප්‍රියන්තද මේ පන්තියේම සිටි ළමයෙකි. චන්දිම නාමරත්න හා මා අතර යම් සටනක් (ලස්සනටම අකුරු ලිවීම වගේ) පැවතියද කිරඹඔය විදයලයේදී දිගටම පන්තියේ පළමුවෙනියා වූ මට නාමරත්න පසුකර යාම මහා ලොකු කජ්ජක් නොවීය.

මගේ හිත වැඩිපුර තිබුනේ නාමරත්න යන පැත්තේ නොවේ.. ප්‍රියංක, ලලිත් , සහන් යන දිශාවෙයි.. අප විවේක කාලයේදී කතාකළේ වෙනත් මාතෘකා බව පමණක් මෙහි සඳහන් කරන්නේ එම මාතෘකා වල ප්‍රධාන චරිත තවමත් අප සමග හිතවත් කම් ඇති පන්ති යේ සිටි යහළු යෙහෙලියන් නිසයි.

### බයිලා චක්‍රවර්ති

එසේම අපි විවේක කාලයේදී කවකටු පෙට්ටි ඩ්‍රම් සෙට් එකක් හදාගෙන සින්දු කියන එකත් කළෙමු. ඒ අර අප කී චරිත වලට පෙනෙන හා ඇහෙන ලෙසයි.

අපේ අම්මාගේ මල්ලී සුට්ටන් මාමා මේ දිනවල ලුණුගල ගොස් මැණික් ගරා යහමින් මුදල් ඇතිව සිටි අයෙකි. ඔහු ඔහුගේ නැෂනල් පැනසොනික් කැසට් යන්ත්‍රයේ නිතරම වාදනය කරමින් සිටි ගීත මටද කට පාඩම් වුයේ නිතැතින්මය. මම මේ ගීත සමහරක් අපේ විවේක කාලයේ බජව්වේදී ගායනා කර කොල්ලන් අතර නමක් දිනගත්තෙමි.

මා කොතරම් ජනප්‍රිබය බයිලා ගායකයෙක් වුවාද කියතොත් බිත්තියෙන් එහා පැත්තේ තිබු සමන් හා රෝස පන්ති වල සිකුරාදා හවස සාහිත්‍ය සමිතියේ ගීත ගයන කරන්නටද මට ආරාධනා ලැබුණි. මම ඩෙස්මන් ද සිල්වා ගේ "කොල්ලුපිටියේ ජන-"ක්ෂන්" නිහාල් නෙල්සන්ගේ "පොල්කටු හැන්දේ මිට වගේ" වැනි ගීත පන්ති භාර ටීචර්ලා හතර දෙනාම සිටින සමිතියේදී ගායනා කළෙමි.

හතර සමන්, රෝස පන්ති දෙකෙන් එකක හිටි සුදු පොඩි කොල්ලෙක් අපේ බජව් කල්ලිය අසලට යන්නට එන්නට පුරුදු වුයේ මේ කාලයේදීමය. ඔහු ප්‍රියංකලාගේ ගජයෙකි. කල්ලියේ දී හමුවී "මචන් කිටී" යැයි කියා කතා කලද මට ඒ කොල්ලගේ එතරම් විශේෂයක් තිබුනේ නැත.

ඔහු මා යන 318 ගල්ඒදණ්ඩ පරණ බෙන්ස් පාසල් බස් රථයේම ගමන් කරන තවත් එකෙක් බව මට යම්තම් මතකයේ තිබුණි. එකල 318 බසයේ ගිය අනිත් සගයින් වුයේ ගල්ඒදණ්ඩ වැසියන්ම වූ බන්දුපාල හා ප්‍රේමශීලයි. හවසට අරලගංවිල මහා විද්‍යාලයට ගොස් 318 බසයට ගොඩවන අප ඉන් පසු නිවෙස් බලා යන්නේ බසයේදීද උපරිම විනෝද වීමෙන් පසුවයි.

318 බස් කල්ලියේ සිටි හතර වෙනියා, පන්තියේදී අපේ බජව් කල්ලියට ආව ගිය, චමින්ද රාජපක්ෂ නම් ඔහුය.

ළබන කළාපයට